සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

| | |
|---|---|
| භූගෝල විද්‍යාව I<br>புவியியல் I<br>Geography I | 22 S I |

**උපදෙස්:**

- ※ **II** කොටසෙහි ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සැපයිය යුතු ය.
- ※ **III** කොටස ප්‍රශ්න **හතරකින්** සමන්විත වන අතර ඉන් තෝරාගත් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
- ※ මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා 1:50 000 භූ ලක්ෂණ සිතියමක කොටසක්, ලෝක ආකෘති සිතියමක් සහ ප්‍රස්තාර කඩදාසි දෙකක් සපයනු ලැබේ.

## II කොටස

**1.** ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත් කරන ලද 1:50 000 පරිමාණයේ දඹුල්ල භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් ඔබට සපයා ඇත. එහි සමෝච්ච රේඛා අන්තරය **මීටර 20** කි. එම සිතියම පාදක කර ගනිමින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**සැලකිය යුතුයි:**

- ※ **ප්‍රශ්නයට අදාළ අංකය** සහ අදාළ **උප කොටස්වල අංක** පිළිතුරු පත්‍රයේ පැහැදිලි ව සඳහන් කළ යුතු ය.
- ※ **භූ ලක්ෂණ සිතියමෙහි පිළිතුරු ලිවිය යුතු නොවේ.**
- ※ සපයා ඇති භූ ලක්ෂණ සිතියම ඔබේ පිළිතුරු පත්‍රයට ඇමිණිය යුතු **නොවේ**.

(i) Ⓐ අක්ෂරයෙන් දක්වා ඇති භූරූප ලක්ෂණය නම් කරන්න. (ලකුණු 01)

(ii) Ⓑ - Ⓒ සහ Ⓓ - Ⓔ රේඛාවලින් දක්වා ඇති භූරූප ලක්ෂණ **දෙක** අනුපිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02)

(iii) සිතියම් ප්‍රදේශයේ Ⓕ අක්ෂරයෙන් දක්වා ඇත්තේ කුමන ලක්ෂණයක් ද? (ලකුණු 01)

(iv) Ⓖ සහ Ⓗ අක්ෂරවලින් දක්වා ඇති පරිපාලන මායිම් **දෙක** අනුපිළිවෙළින් දක්වන්න. (ලකුණු 02)

(v) කණ්ඩලම වැව් බැම්මෙහි දිග කිලෝමීටරවලින් ගණනය කර දක්වන්න. (ලකුණු 01)

(vi) Ⓚ චතුරශ්‍රය තුළ පිහිටි ඕනෑම රාජ්‍ය ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 01)

(vii) පහත සඳහන් මාතෘකා **තුන** යටතේ සිතියම් ප්‍රදේශයේ කැපී පෙනෙන ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න.
(අ) මාර්ග ජාලය (ආ) වනාන්තර හා ලඳු කැලෑ (ඉ) ජනාවාස (ලකුණු 06)

(viii) සිතියම් ප්‍රදේශයේ වී වගාවේ ව්‍යාප්තිය පහත සඳහන් සාධක **තුනට** අදාළව සාකච්ඡා කරන්න.
(අ) උන්නතාංශය (ආ) අතු ගංගා හා අපශාඛා (ඉ) වාරි ජල සැපයුම (ලකුණු 06)

**2.** සම්මත වර්ණ සහ සංකේත භාවිත කර සපයා ඇති ලෝක සිතියමේ පහත සඳහන් දෑ සලකුණු කර නම් කරන්න.

- නයිජර් ගඟ
- 80°.00' E (නැගෙනහිර දේශාංශය)
- මධ්‍යධරණී මුහුද
- ටිටිකාකා විල
- රොකී කඳුවැටිය
- බංග්ලාදේශය
- ග්‍රීන්ලන්තය
- ස්ටෙප් තෘණ භූමිය
- ඕස්ට්‍රේලියාවේ අග නගරය
- 2026 මුල් කාලයේ ඉරානය සහ ඇමරිකා එක්සත් ජනපදය අතර ඇති වූ ගැටුමේ දී නාවික ප්‍රවාහනය අවහිර කළ සමුද්‍රසන්ධිය

(ලකුණු 10)

[දෙවැනි පිටුව බලන්න

Scanned with CamScanner

## III කොටස

3. (i) සිතියමක් යනු කුමක් ද? (ලකුණු 02)

(ii) භූ ලක්ෂණ සිතියම්වල සුවිශේෂත්වය ලක්ෂණ **දෙකක්** ඇසුරින් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(iii) තේමා සිතියම්වල ප්‍රයෝජන **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

(iv) මුද්‍රිත සිතියම් සහ අංකිත සිතියම් අතර පවතින වෙනස්කම් **තුනක්** සංසන්දනාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 06)

4. (i) දුරස්ථ සංවේද දත්ත ලබාගැනීමට භාවිත කළ හැකි මූලාශ්‍ර **හතරක්** නම් කරන්න. (ලකුණු 02)

(ii) දුරස්ථ සංවේද වේදිකා වර්ග **තුන** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

(iii) සුදුසු උදාහරණ සහිතව දුරස්ථ සංවේද තාක්ෂණයේ භාවිත **තුනක්** පරීක්ෂා කරන්න. (ලකුණු 06)

(iv) සංවර්ධන ක්‍රියාවලියේ දී දුරස්ථ සංවේද තාක්ෂණය භාවිත කිරීමේ දී ශ්‍රී ලංකාව මුහුණදෙන අභියෝග **දෙකක්** සාකච්ඡා කරන්න. (ලකුණු 04)

5. ශ්‍රී ලංකාවේ 2000 - 2025 කාලය තුළ යල කන්නයේ සාමාන්‍ය වී අස්වැන්න වගුව 01හි දැක්වේ. දී ඇති එම දත්ත භාවිතකර පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**වගුව 01 : ශ්‍රී ලංකාවේ 2000 - 2025 කාලය තුළ යල කන්නයේ සාමාන්‍ය වී අස්වැන්න (හෙක්ටයාරයකට කිලෝග්‍රෑම්වලින්)**

| වර්ෂය | සාමාන්‍ය වී අස්වැන්න |
|---|---|
| 2000 | 3697 |
| 2001 | 4119 |
| 2002 | 3773 |
| 2003 | 3709 |
| 2004 | 4244 |
| 2005 | 3976 |
| 2006 | 4263 |
| 2007 | 4543 |
| 2008 | 4195 |
| 2009 | 4186 |
| 2010 | 4444 |
| 2011 | 4347 |
| 2012 | 4145 |

| වර්ෂය | සාමාන්‍ය වී අස්වැන්න |
|---|---|
| 2013 | 4408 |
| 2014 | 4204 |
| 2015 | 4527 |
| 2016 | 4417 |
| 2017 | 4291 |
| 2018 | 4683 |
| 2019 | 4696 |
| 2020 | 4770 |
| 2021 | 4691 |
| 2022 | 3407 |
| 2023 | 4128 |
| 2024 | 4599 |
| 2025 | 4820 |

මූලාශ්‍රය - *Department of Censes and Statistics, 2026*

(i) සංඛ්‍යාත බහු අස්‍රයක් යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02)

(ii) පහත දැක්වෙන පන්ති ප්‍රාන්තර භාවිතයෙන් වගුව 01 හි දත්ත සඳහා සංඛ්‍යාත වගුවක් සකස් කරන්න.
(3400 - 3649, 3650 - 3899, 3900 - 4149, 4150 - 4399, 4400 - 4649, 4650 - 4899) (ලකුණු 03)

(iii) ඉහත 5 (ii) හි ඔබ විසින් සකස් කරන ලද සංඛ්‍යාත වගුව භාවිතයෙන් ජාල රේඛයක් සහ සංඛ්‍යාත බහු අස්‍රයක් නිර්මාණය කරන්න (සපයා ඇති ප්‍රස්තාර කඩදාසිය භාවිත කරන්න). (ලකුණු 08)

(iv) සංඛ්‍යාත බහු අස්‍රය මගින් පෙන්නුම් කරන පරිදි යල කන්නයේ සාමාන්‍ය වී අස්වැන්නෙහි හඳුනාගත හැකි ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02)

Scanned with CamScanner

**6.** ශ්‍රී ලංකාවේ වයස් කාණ්ඩ හා පුම්තිරිබව අනුව 2025 වර්ෂයේ ජනසංඛ්‍යාව වගුව 02හි දක්වා ඇත. එම දත්ත භාවිත කර පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**වගුව 02 : වයස් කාණ්ඩ හා පුම්තිරිබව අනුව ශ්‍රී ලංකාවේ ජනසංඛ්‍යාව - 2025 (දහස් ගණනින්)**

| වයස් කාණ්ඩ | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| 0 - 9 | 1 398 | 1 371 | 2 769 |
| 10 - 19 | 1 787 | 1 739 | 3 526 |
| 20 - 29 | 1 451 | 1 526 | 2 977 |
| 30 - 39 | 1 386 | 1 478 | 2 864 |
| 40 - 49 | 1 515 | 1 575 | 3 090 |
| 50 - 59 | 1 253 | 1 362 | 2 615 |
| 60 - 69 | 993 | 1 178 | 2 171 |
| 70 - 79 | 559 | 758 | 1 317 |
| 80+ | 158 | 269 | 427 |

මූලාශ්‍රය - *Registrar General's Department, 2025 (Estimated)*

(i) **වගුව 02** හි දක්වා ඇති ජනසංඛ්‍යා දත්ත නිරූපණය කිරීම සඳහා පිරමීඩ ප්‍රස්තාරයක් අඳින්න (සපයා ඇති ප්‍රස්තාර කඩදාසිය භාවිත කරන්න). (ලකුණු 08)

(ii) ඔබ විසින් නිර්මාණය කරන ලද ජනසංඛ්‍යා පිරමීඩ ප්‍රස්තාරය ඇසුරින් 0-19, 20-59 සහ 60 ට වැඩි වයස් කාණ්ඩ සඳහා හඳුනාගත හැකි **එක්** කැපී පෙනෙන ලක්ෂණයක් බැගින් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

(iii) ඉහත ජනසංඛ්‍යා දත්ත නිරූපණය කිරීමට යොදාගත් පිරමීඩ ප්‍රස්තාරයේ වාසි **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04)


***

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

**22 | I**

භූගෝල විද්‍යාව I
புவியியல் I
Geography I

31320




SCALE 1 : 50 000

සමෝච්ච රේඛා අන්තරය මීටර 20
சமவுயரக்கோட்டு இடைவெளி 20 மீற்றர்
Contour Line Interval 20 metre

Scanned with CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப்) பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

| | |
|---|---|
| භූගෝල විද්‍යාව | II |
| புவியியல் | II |
| Geography | II |

**22 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**උපදෙස් :**
* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්වත්** තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස - භෞතික භූගෝල විද්‍යාව

**1.** (i) භෞම පද්ධතිය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) ජෛව ගෝලයේ සුවිශේෂී ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)


(iii) ජෛව ගෝලය අනෙක් උප පද්ධති තුන සමග අන්තර්ක්‍රියා කරන ආකාරය රූප සටහනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) ජෛව ගෝලයට අහිතකර ලෙස බලපාන භෞතික සාධක **තුනක්** පරීක්ෂා කරන්න. (ලකුණු 06 යි)

**2.** (i) නිම්න ග්ලැසියර යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) කඳුකර ප්‍රදේශවල පවතින නිම්න ග්ලැසියරවල ප්‍රධාන ක්‍රියාකාරකම් **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) රූප සටහන 01 හි A, B, C, D, E සහ F ලෙස සලකුණු කර ඇති නිම්න ග්ලැසියර භූ රූප **හය** නම් කරන්න. (ලකුණු 06 යි)




රූප සටහන 01

(iv) පහත සඳහන් ග්ලැසියර ආශ්‍රිත භූ රූප **තුන**, ඒවායේ පිහිටීම අනුව සුදුසු කටු සටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න.
(අ) ආංශික මොරේන (ආ) මැදි මොරේන (ඇ) අග් මොරේන (ලකුණු 06 යි)

**3.** (i) ආපදා කළමනාකරණය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යභාරයන් **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ආපදා කළමනාකරණ චක්‍රයේ ප්‍රධාන අදියර **හතර** රූපසටහනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ 'දිට්වා' ආපදා කාලයේ දී හා එයින් පසු රජය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

[දෙවැනි පිටුව බලන්න

Past Papers Wiki


4. (i) බියෝමයක් යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) ලෝකයේ බියෝම විවිධත්වයට බලපාන ප්‍රධාන සාධක **තුන** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ලෝකයේ නිවර්තන වර්ෂා වනාන්තර බියෝමයේ ප්‍රධාන ලක්ෂණ **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) මානව ක්‍රියාකාරකම් හේතුවෙන් නිවර්තන වර්ෂා වනාන්තර මුහුණ දෙන ගැටලු **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

## II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

5. 2017 වර්ෂය සඳහා ලෝකයේ ප්‍රධාන කලාප අනුව වයස අවුරුදු 60 ට වැඩි වියපත් පුද්ගලයින්ගේ ව්‍යාප්තිය සහ 2050 වර්ෂය සඳහා පුරෝකථනය කරන ලද දත්ත වගුව 01 හි දැක්වේ. එම දත්ත භාවිත කර පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**වගුව 01 : 2017 සහ 2050 සඳහා ලෝකයේ ප්‍රධාන කලාප අනුව අවුරුදු 60ට වැඩි වියපත් පුද්ගලයින්ගේ ව්‍යාප්තිය**

| ප්‍රධාන කලාප | වයස අවුරුදු 60ට වැඩි වියපත් පුද්ගලයින් | | | |
|---|---|---|---|---|
| | 2017 | | 2050 (පුරෝකථනය කරන ලද) | |
| | මිලියන | ප්‍රතිශතය | මිලියන | ප්‍රතිශතය |
| අප්‍රිකාව | 68.8 | 7.2 | 225.8 | 10.9 |
| ආසියාව | 549.2 | 57.1 | 1273.2 | 61.2 |
| යුරෝපය | 183.0 | 19.0 | 247.2 | 11.9 |
| උතුරු ඇමරිකාව | 78.4 | 8.1 | 122.8 | 5.9 |
| ලතින් ඇමරිකාව සහ කැරිබියන් | 76.0 | 7.9 | 198.2 | 9.5 |
| ඕෂනියාව | 6.9 | 0.7 | 13.3 | 0.6 |
| **ලෝකය** | **962.3** | **100.0** | **2080.5** | **100.0** |

මූලාශ්‍රය : *United Nations (2018)*

(i) වියපත් දර්ශකය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) 2017 දී ලෝකයේ ප්‍රධාන කලාපවල අවුරුදු 60 ට වැඩි වියපත් පුද්ගලයින්ගේ ව්‍යාප්තියේ කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) 2017 හා සසඳන විට 2050 දී ලෝකයේ ප්‍රධාන කලාපවල අවුරුදු 60 ට වැඩි වියපත් පුද්ගලයින්ගේ ව්‍යාප්තියේ වෙනස්වීම් **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

(iv) වියපත් ජනගහනයේ වැඩිවීම හේතුවෙන් ශ්‍රී ලංකාව මුහුණ දෙන අභියෝග **තුනක්** පරීක්ෂා කරන්න. (ලකුණු 06 යි)

6. (i) ලෝකයේ ප්‍රධාන ජනාවාස රටා **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) සවිධි ජනාවාසවල උප බෙදීම් **තුන** උදාහරණ සමඟ විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ග්‍රාමීය ජනාවාසවල පොදුවේ දක්නට ලැබෙන ලක්ෂණ **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ මහවැලි ජනාවාස ධූරාවලියේ මට්ටම් **හතර** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

7. පහත වගුව 02 හි 2014 සහ 2022 දී ලෝක යපස් නිෂ්පාදනයේ ව්‍යාප්තිය පෙන්වයි. එම දත්ත භාවිත කර පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**වගුව 02 : 2014 සහ 2022 දී ලෝක යපස් නිෂ්පාදනය (ටොන් මිලියන)**

| රටවල් | ලෝක යපස් නිෂ්පාදනය | | | |
|---|---|---|---|---|
| | 2014 | | 2022 | |
| | ටොන් මිලියන | ප්‍රතිශතය | ටොන් මිලියන | ප්‍රතිශතය |
| ඕස්ට්‍රේලියාව | 767 | 32.9 | 880 | 33.9 |
| බ්‍රසීලය | 411 | 17.6 | 410 | 15.9 |
| චීනය | 369 | 15.8 | 380 | 14.6 |
| ඉන්දියාව | 129 | 5.5 | 230 | 8.8 |
| රුසියාව | 102 | 4.4 | 100 | 3.8 |
| දකුණු අප්‍රිකාව | 78 | 3.3 | 61 | 2.3 |
| ඇමරිකා එක්සත් ජනපදය | 58 | 2.5 | 46 | 1.8 |
| ඉරානය | 45 | 1.9 | 50 | 1.9 |
| කැනඩාව | 41 | 1.8 | 68 | 2.6 |
| වෙනත් රටවල් | 330 | 14.3 | 375 | 14.4 |
| **ලෝක එකතුව** | **2 330** | **100.0** | **2 600** | **100.0** |

මූලාශ්‍රය : *USGS Mineral Commodity Summaries, 2024*

(i) නිෂ්පාදන කර්මාන්ත සඳහා වැදගත් අමුද්‍රව්‍යයක් ලෙස යපස් සැලකීමට හේතු **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ii) 2014 දී ලෝක යපස් නිෂ්පාදනයේ ව්‍යාප්ති රටාවේ කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) 2014 ට සාපේක්ෂව 2022 දී ලෝකයේ යපස් නිෂ්පාදනයේ වෙනස්වීම් **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) ලෝක යපස් කැණීම් කර්මාන්තය ආශ්‍රිත ගැටලු **තුනක්** පරීක්ෂා කරන්න. (ලකුණු 06 යි)

8. (i) ශ්‍රී ලංකාවට පැමිණෙන ආගන්තුකයෙකු සංචාරකයෙකු ලෙස සලකනු ලබන නිර්ණායකය සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ජාත්‍යන්තර සංචාරකයින් ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා බලපාන ප්‍රධාන අරමුණු **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ශ්‍රී ලංකාව ජාත්‍යන්තර සංචාරකයින්ට පිරිනමන ප්‍රධාන සංචාරක ප්‍රභේද **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා මෑත කාලීනව රජය විසින් අනුගමනය කර ඇති පියවර **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

* * *

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library